WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020

# 62 - පුරවැසි අධ්‍යාපනය

ලකුණු දීමේ පටිපාටිය







අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

## 62 - පුරවැසි අධ්‍යාපනය 1, 11

## අවසාන ලකුණු ගණනය කිරීම

### 1 පත්‍රය

ප්‍රශ්න අංක 01 - 40 (01 X 40) ලකුණු 40

### II පත්‍රය

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුය.

| | | |
|---|---|---|
| 1. ප්‍රශ්නය | ලකුණු 20 | |
| 2. ප්‍රශ්නය | ලකුණු 10 | ප්‍රශ්න 04 කට ලකුණු 10 x 4 = 40 |
| 3. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 4. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 5. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 6. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 7. ප්‍රශ්නය | ලකුණු 10 | |

WWW.OLEVELAPI.COM

| | | |
|---|---|---|
| **I පත්‍රය** | | ලකුණු 40 |
| **II පත්‍රය** | 20 + 40= | ලකුණු 60 |
| | **අවසාන** | **ලකුණු100** |

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

### උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ලකුණු සටහන් කිරීමේ දී පැහැදිලි ඉලක්කමෙන් ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................................ √ △ $\frac{4}{5}$

(ii) ........................................................ √ △ $\frac{3}{5}$

(iii) ........................................................ √ △ $\frac{3}{5}$

(03) එකතුව → □ $\frac{10}{15}$

WWW.OLEVELAPI.COM

බහුවරණ උත්තරපත්‍ර :

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
**V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.
II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.
III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**
IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව ෂෂ පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.
V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**
VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි II පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- ( I ) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**( II ) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**62 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
- ※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- ※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ජී.ඩී.එච්. කෝල්ගේ නිර්වචනයට අනුව බාහිර බාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කරගැනීමට ඇති ඉඩ ප්‍රස්තාව හැඳින්වෙන්නේ,
(1) අයිතිවාසිකම් ලෙසට ය. (2) සමානාත්මතාව ලෙසට ය.
(3) නිදහස ලෙසට ය. (4) සාධාරණත්වය ලෙසට ය.

**2.** ගැටුම් නිරාකරණය කිරීමේ අපේක්ෂාවෙන් පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත මත තීරණ ක්‍රියාවට නැංවීම හඳුන්වන සංකල්පය කුමක් ද?
(1) බේරුම් කිරීම (2) කෝවල් කිරීම (3) විනිසීම (4) මැදිහත්කරණය

**3.** එක් සමාජයක් තුළ විවිධ සංස්කෘතීන්ට අයත් ජන කොටස් සාමූහිකව ජීවත් වන්නේ නම්, එම සමාජය හඳුන්වන්නේ,
(1) බහු ආගමික සමාජයක් ලෙසට ය. (2) බහු සංස්කෘතික සමාජයක් ලෙසට ය.
(3) බහු වාර්ගික සමාජයක් ලෙසට ය. (4) බහු ජාතික සමාජයක් ලෙසට ය.

**4.** මහජන නියෝජිතයන් මගින් රටක පාලන කටයුතු මෙහෙයවීම
(1) සෘජු ප්‍රජාතන්ත්‍රවාදයයි. (2) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයයි.
(3) ජනතා ප්‍රජාතන්ත්‍රවාදයයි. (4) පුරවැසි ප්‍රජාතන්ත්‍රවාදයයි.

**5.** ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතිය වන්නේ,
(1) සිවිල් නීතියයි. (2) මානව හිමිකම් නීතියයි.
(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි. (4) අපරාධ නීතියයි.

**6.** ව්‍යවසායකත්වය නැමැති නිෂ්පාදන සාධකය සඳහා කරනු ලබන ගෙවීම කුමක් ද?
(1) වැටුප (2) බදු කුලිය (3) පොලිය (4) ලාභය

**7.** සාමකාමීව එක්රැස් වීමේ අයිතිය අයත් වන්නේ පහත සඳහන් මානව හිමිකම් අතරින් කුමන අංශයට ද?
(1) ආගමික හිමිකම් (2) සංස්කෘතික හිමිකම්
(3) දේශපාලන හිමිකම් (4) ආර්ථික හිමිකම්

**8.** නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙක
(1) ප්‍රාග්ධන සූක්ෂම හා ශ්‍රම සූක්ෂම වේ. (2) රාජ්‍ය සූක්ෂම හා පෞද්ගලික සූක්ෂම වේ.
(3) තාක්ෂණ සූක්ෂම හා ප්‍රාග්ධන සූක්ෂම වේ. (4) පාරිභෝගික සූක්ෂම හා වෙළඳ සූක්ෂම වේ.

9. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියන් විසින් ඉටු කළ යුතු නීතිමය යුතුකමක් වන්නේ,
(1) සම්ප්‍රදායන්ට ගරු කිරීමයි.
(2) සාරධර්ම අනුව හැසිරීමයි.
(3) ආගමානුකූලව කටයුතු කිරීමයි.
(4) මහජන දේපල ආරක්ෂා කිරීමයි.

10. මිනිසාගේ පැවැත්ම සඳහා පරිසරයෙන් ලබාදෙන සේවා වන්නේ,
(1) සමාජ පරිසරය සුරැකීමේ සේවා ය.
(2) අපද්‍රව්‍ය අවශෝෂණය කිරීමේ සේවා ය.
(3) ස්වභාවික ආපදා පාලනය කිරීමේ සේවා ය.
(4) ආරක්ෂාව සහතික කිරීමේ සේවා ය.

11. පුද්ගලයා තුළ හා පුද්ගලයන් අතර ඇතිවන ගැටුම් හඳුන්වන්නේ,
(1) පුද්ගල ගැටුම් ලෙසට ය.
(2) සමාජීය ගැටුම් ලෙසට ය.
(3) සූක්ෂම ගැටුම් ලෙසට ය.
(4) පවුල් ගැටුම් ලෙසට ය.

12. නීතිපතිතුමාගේ කාර්යයන් සඳහා සහාය වන නිලධාරියකු වන්නේ මින් කවු ද?
(1) පොලිස්පතිතුමා
(2) අග්‍ර විනිශ්චයකාරතුමා
(3) අධිකරණ ඇමතිතුමා
(4) සොලිස්ටර් ජනරාල්තුමා

13. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මහ නගර සභාවක ප්‍රධානියා වන්නේ,
(1) නගරාධිපති ය. (2) ප්‍රධාන ලේකම් ය. (3) සභාපති ය. (4) කොමසාරිස් ය.

14. පළාත් සභාවක මහ ඇමතිවරයා පත් කිරීමට බලය ඇත්තේ,
(1) ජනාධිපතිවරයාටයි.
(2) ආණ්ඩුකාරවරයාටයි.
(3) පක්ෂ නායකයාටයි.
(4) මැතිවරණ කොමිසමේ සභාපතිටයි.

15. ප්‍රාථමික මහේස්ත්‍රාත් අධිකරණයෙන් දෙන ලද තීන්දුවකට එරෙහිව අභියාචනා කළ හැකි ඉහළ අධිකරණ ආයතනය කුමක් ද?
(1) අභියාචනාධිකරණය
(2) ශ්‍රේෂ්ඨාධිකරණය
(3) දිසා අධිකරණය
(4) පළාත්බද මහාධිකරණය

16. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බලපෑ භූගෝලීය සාධකයක් වන්නේ,
(1) දකුණු ආසියාතික රටක් වීම ය.
(2) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම ය.
(3) සංචාරකයන්ට යෝග්‍ය වෙරළ තීරයක් පිහිටා තිබීම ය.
(4) ත්‍රිකුණාමලයේ ස්වභාවික වරායක් පිහිටා තිබීම ය.

17. පෘථිවියේ ස්වභාවික සංසිද්ධීන් මගින් ඇති වන පාරිසරික ගැටලු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) භූමිකම්පා, නියඟ, ගිනිකඳු
(2) නායයාම්, ටොනාර්ඩෝ, වායු දූෂණය
(3) භූමිකම්පා, ජලගැලීම්, ජල දූෂණය
(4) සුළි කුණාටු, වනභායනය, ලැව්ගිනි

18. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ක්‍රියාත්මක වන නූතන රාජ්‍යයන් උත්සාහ ගන්නේ,
(1) සන්නිවේදන සේවා සම්බන්ධීකරණය කිරීමටයි.
(2) ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම තහවුරු කිරීමටයි.
(3) ගෝලීයකරණ අරමුණු තහවුරු කිරීමටයි.
(4) සංස්කෘතික විවිධතා තුළ ජාතිය ගොඩනැගීමටයි.

19. දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඇමරිකා එක්සත් ජනපදය යුරෝපා රටවල් සමග එකතු වී පිහිටුවා ගත් සංවිධානය කුමක් ද?
(1) බිම්ස්ටෙක් (BIMSTEC)
(2) ආසියාන් (ASEAN)
(3) නේටෝ (NATO)
(4) යුනෙස්කෝ (UNESCO)

20. ශ්‍රී ලංකාවේ වසර 30 ක් පමණ පැවති ජන වාර්ගික ගැටුම අයත් වන්නේ කුමන ගැටුම් වර්ගයට ද?
(1) පුද්ගල ගැටුම් (2) සමාජ ගැටුම් (3) ආගමික ගැටුම් (4) ආර්ථික ගැටුම්

21. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් රටවල් අතුරෙන් නිෂේධ බලය භාවිත කළ හැකි ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රට කුමක් ද?
(1) ප්‍රංශය (2) කැනඩාව (3) ජපානය (4) ජර්මනිය

22. ග්‍රීක පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය හැඳින්වූයේ කුමන නමකින් ද?
(1) සෙනෙට් සභාව (2) විධායක සභාව (3) පුරවැසි සභාව (4) පාලක සභාව

**23.** රාජ්‍යයක පරමාධිපත්‍ය බලය පවතින්නේ,
(1) විධායකය වෙත ය. (2) පාර්ලිමේන්තුව වෙත ය.
(3) අධිකරණය වෙත ය. (4) මහජනතාව වෙත ය.

**24.** ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූපයක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) සංස්කෘතික උපාය සම්බන්ධතා (2) යුද උපාය සම්බන්ධතා
(3) දේශපාලන උපාය සම්බන්ධතා (4) ආගමික උපාය සම්බන්ධතා


**25.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මුල්වරට ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් වැදගත් අංගයක් වන්නේ,
(1) අග්‍රාණ්ඩුකාර ධුරයයි. (2) ව්‍යවස්ථාදායක සභාවයි.
(3) මැතිවරණ කොමිෂන් සභාවයි. (4) විධායක ජනාධිපති ක්‍රමයයි.

**26.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව සකස් කර ඇති සංවෘත ලැයිස්තුවට අනුකූලව, මධ්‍යම ආණ්ඩුව සතු බලතලය කුමක් ද?
(1) ජාතික නිවාස සහ ඉදිකිරීම (2) ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන
(3) සමාජ සේවා සහ පුනරුත්ථාපන (4) කෘෂිකර්ම සහ ගොවිජන සේවා

**27.** මානව සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන සංරචක ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ක්‍රය ශක්තිය මත ගැළපූ ඒක පුද්ගල ආදායම, අධ්‍යාපනය, උපතේ දී ආයු අපේක්ෂාව
(2) ක්‍රය ශක්තිය මත ගැළපූ ඒක පුද්ගල ආදායම, දළ ජාතික නිෂ්පාදනය, මාතෘ මරණ අනුපාතිකය
(3) ක්‍රය ශක්තිය මත ගැළපූ ඒක පුද්ගල ආදායම, ළදරු මරණ අනුපාතිකය, ශුද්ධ ජාතික නිෂ්පාදනය
(4) ක්‍රය ශක්තිය මත ගැළපූ ඒක පුද්ගල ආදායම, විදේශ ණය අනුපාතිකය, වැඩිහිටි සාක්ෂරතාව

**28.** වර්තමාන ලෝකයේ සංස්කෘතික සම්මිශ්‍රණය සඳහා බලපා ඇති වැදගත්ම හේතුව කුමක් ද?
(1) රටවල භූගෝලීය පිහිටීම (2) වෙළඳ සබඳතා පුළුල් වීම
(3) බටහිර රටවලට යටත් වීම (4) විශ්ව ගම්මානයක් බවට පත් වීම

**29.** පහත දැක්වෙන්නේ ගැල්ටුන්ගේ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියයි.




මෙහි A, B හා C පිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?
(1) චර්යාව, ආකල්ප, විශ්වාස (2) චර්යාව, සන්දර්භය, ආකල්ප
(3) ආකල්ප, සන්දර්භය, පුරුදු (4) සන්දර්භය, පරිසරය, සබඳතා

**30.** නියම කරන ලද වයස් සීමාව ඉක්ම වූ ජනතාවට පාලකයන් තෝරා ගැනීමට ඇති බලය හඳුන්වන්නේ,
(1) සර්වජන ඡන්ද බලය ලෙසට ය. (2) ස්වාධිපති ඡන්ද බලය ලෙසට ය.
(3) සමානුපාතික ඡන්ද බලය ලෙසට ය. (4) නියෝජිත ඡන්ද බලය ලෙසට ය.

**31.** ඇමරිකා එක්සත් ජනපදයේ සෙනෙට් සභාවට නියෝජිතයන් පත් කරනු ලබන්නේ,
(1) ජනාධිපතිවරයා විසිනි. (2) ෆෙඩරල් අධිකරණය විසිනි.
(3) ප්‍රාන්ත ආණ්ඩු විසිනි. (4) කොංග්‍රස් මණ්ඩලය විසිනි.

**32.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සේවක අයිතිවාසිකමක් **නොවන** ප්‍රකාශය තෝරන්න.
(1) ආයතනයේ අරමුණු අනුව වැඩ කිරීම
(2) පැය අටක සේවා කාලයක් තුළ වැඩ කිරීම
(3) නිවාඩු ලබා ගැනීමට තිබෙන හැකියාව
(4) සේවක සුරක්ෂිතතාව ලබා ගැනීම

**33.** සන්ධීය ආණ්ඩුක්‍රමයක් පවතින රටක් වන්නේ,
(1) මහා බ්‍රිතාන්‍යයයි. (2) ශ්‍රී ලංකාවයි. (3) රුසියාවයි. (4) ස්විට්සර්ලන්තයයි.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**34.** ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට අවශ්‍ය සාධකයක් වන්නේ,
(1) නීතියේ ආධිපත්‍ය පැවතීමයි. (2) ජනතා ගැටලු ඉදිරිපත් කිරීමට හැකිවීමයි.
(3) දිළිඳුකම තුරන් කිරීමයි. (4) විදේශ සබඳතා තර කිරීමයි.

**35.** ඡන්දදායකයින්ට කිසිදු අයුතු බලපෑමකින් තොරව තම දේශපාලන මතය මැතිවරණයක දී ප්‍රකාශ කිරීමට ඉඩ සැලසීම පහත කවර මැතිවරණ ක්‍රමයක මූලික ලක්ෂණයක් ද?
(1) සාමකාමී මැතිවරණයක (2) නිදහස් මැතිවරණයක
(3) ජාතික මැතිවරණයක (4) ජනතාවාදී මැතිවරණයක

**36.** ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති මහජන සෞඛ්‍ය සේවාවක් වන්නේ,
(1) පොදු නාන ස්ථාන පවත්වාගෙන යාමයි. (2) ශුද්ධ පවිත්‍ර කටයුතු සඳහා නළ යෙදීමයි.
(3) ක්‍රීඩාපිට්ටනි පවත්වාගෙන යාමයි. (4) මහජනයාගේ සනීපාරක්ෂක තත්ත්වය වැඩිදියුණු කිරීමයි.

**37.** ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මානව හිමිකම් හඳුන්වන සංකල්පය කුමක් ද?
(1) සමාජ අයිතිවාසිකම් (2) ජනතා අයිතිවාසිකම්
(3) මූලික අයිතිවාසිකම් (4) ප්‍රජා අයිතිවාසිකම්

**38.** ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට අත් වී ඇති ඍණාත්මක බලපෑමක් තෝරන්න.
(1) බුද්ධිගලනය ඉහළ යාම (2) ආර්ථිකය විවිධාංගීකරණය වීම
(3) වෙළඳ ශේෂය තුලනය වීම (4) නවීන තාක්ෂණය ගලා ඒම

**39.** පහත සඳහන් **'අ'** කොටසින් විවිධ අර්ථ ක්‍රමවල ලක්ෂණ හා **'ආ'** කොටසින් අර්ථ ක්‍රමයන් දැක්වේ.

| **'අ' – අර්ථ ක්‍රමවල ලක්ෂණ** | **'ආ' – අර්ථ ක්‍රම** |
|---|---|
| 1. තරගකාරී වෙළඳපොලක් පැවතීම | A - සමාජවාදී අර්ථ ක්‍රමය |
| 2. දේපළ අයිතිය රජය සතු වීම | B - නව ලිබරල්වාදී අර්ථ ක්‍රමය |
| 3. පොදු යහපත උදෙසා රජය මැදිහත් වීම | C - මිශ්‍ර අර්ථ ක්‍රමය |
| 4. රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම | D - ධනවාදී අර්ථ ක්‍රමය |

**'අ'** තීරුවෙහි අනුපිළිවෙළ අනුව **'ආ'** තීරුව ගැලපූ විට ලැබෙන අර්ථ ක්‍රමයන්හි නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?
(1) CADB (2) CDAB (3) DABC (4) DACB

**40.** පහත සඳහන් 'A' හා 'B' ප්‍රකාශ සලකා බලන්න.
A - යහපාලනය මගින් දූෂණයෙන් හා වංචාවෙන් තොර රාජ්‍ය පාලනයක් ඇති වේ.
B - සෑම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයකම මාධ්‍ය නිදහස තහවුරු කර ඇත.
මෙම ප්‍රකාශ අතරින්
(1) A ප්‍රකාශය මගින් B ප්‍රකාශය පැහැදිලි කරයි.
(2) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වේ.
(3) A ප්‍රකාශය අසත්‍ය වන අතර B ප්‍රකාශය සත්‍ය වේ.
(4) A ප්‍රකාශය සත්‍ය වන අතර B ප්‍රකාශය අසත්‍ය වේ.

* *

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
# க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2020

| විෂය අංකය<br>பாட இலக்கம் | 62 | විෂයය<br>பாடம் | පුරවැසි අධ්‍යාපනය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | **03** | 11. | **03** | 21. | **01** | 31. | **03** |
| 02. | **01** | 12. | **04** | 22. | **03** | 32. | **01** |
| 03. | **02** | 13. | **01** | 23. | **04** | 33. | **04** |
| 04. | **02** | 14. | **02** | 24. | **02** | 34. | **01** |
| 05. | **03** | 15. | **04** | 25. | **04** | 35. | **02** |
| 06. | **04** | 16. | **02** | 26. | **02** | 36. | **04** |
| 07. | **03** | 17. | **01** | 27. | **01** | 37. | **03** |
| 08. | **01** | 18. | **04** | 28. | **04** | 38. | **01** |
| 09. | **04** | 19. | **03** | 29. | **02** | 39. | **04** |
| 10. | **02** | 20. | **02** | 30. | **01** | 40. | **04** |

WWW.OLEVELAPI.COM

**විශේෂ උපදෙස්** / விசேட அறிவுறுத்தல் } **එක් පිළිතුරකට ලකුණු** / ஒரு சரியான விடைக்கு **01** **බැගින්** / புள்ளி வீதம்

**මුළු ලකුණු** / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

**නිවැරදි පිළිතුරු සංඛ්‍යාව** / சரியான விடைகளின் தொகை: **25/40**

**I පත්‍රයේ මුළු ලකුණු** / பத்திரம் I இன் மொத்தப்புள்ளி: **25/40**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

62 - පුරවැසි අධ්‍යාපනය I, II

## II පත්‍රයේ අභිමතාර්ථ

- විෂය නිර්දේශයේ සියලු ඒකක ආවරණය වන පරිදි සුවිශේෂී කරුණු පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම
- ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් ඇතිවීම හේතු හා ගැටුම් නිරාකරණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පිළිබඳව තුලනාත්මක අවබෝධය පරීක්ෂා කිරීම
- ආර්ථික ක්‍රමයක නිෂ්පාදන සාධක, නිෂ්පාදනය සිදු වන අංශ හා නිෂ්පාදන භාණ්ඩවල ස්වභාවය පිළිබඳව දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම
- මානව අයිතිවාසිකම් හා ඒවායේ වැදගත්කම පිළිබඳව දැනුම, අවබෝධය හා ආකල්ප පරීක්ෂා කිරීම
- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අධිකරණ පද්ධතීන් හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම
- බලය බෙදා හැරීම හෝ විමධ්‍යගත කිරීමේ අවශ්‍යතාව, වැදගත්කම හා වාසි අවාසි පිළිබඳ විමර්ශනාත්මක දැනුම පිළිබඳ පරීක්ෂා කිරීම.
- ආණ්ඩුවේ විවිධ ස්ථරයන්හි බලතල, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුම, අවබෝධය හා ආකල්ප පරීක්ෂා කිරීම
- පාරිසරික ගැටලු හා තිරසාර සංවර්ධනය පිළිබඳව රාජ්‍යයේ හා පුරවැසියාගේ යුතුකම් හා ආකල්ප පිළිබඳව පරීක්ෂා කිරීම
- ජාත්‍යන්තර සබඳතා ඇති කර ගැනීමේ අවශ්‍යතාව, වැදගත්කම මෙන්ම වාසි අවාසි පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම

WWW.OLEVELAPI.COM

1. (i) පළාත් සභාවක ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යයන් **දෙකක්** සඳහන් කරන්න.

(ii) ඕනෑම ආර්ථිකයක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න **දෙකක්** සඳහන් කරන්න.

(iii) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළ මූලධර්ම **දෙකක්** දක්වන්න.

(iv) සම්පත්වල ඵලදායිතාව දියුණු කිරීම සඳහා ලෝකයේ දැනට භාවිත වන උපායමාර්ග **දෙකක්** නම් කරන්න.

(v) ශ්‍රී ලංකාවේ පොදු නීතියට අමතරව දැකිය හැකි විශේෂ නීති වර්ග **දෙකක්** සඳහන් කරන්න.

(vi) සාර්ක් සාමාජික රටවල් අතර ඇති කරගෙන ඇති වෙළඳ ගිවිසුම් **දෙක** නම් කරන්න.

(vii) බහු සංස්කෘතික ජන සමාජයක සාමාජිකයන් එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබිය හැකි වාසි **දෙකක්** දක්වන්න.

(viii) පක්ෂ ක්‍රමය තුළ දක්නට ලැබෙන ස්වරූප **දෙකක්** නම් කරන්න.

(ix) එකඟත්වයෙන් ගැටුම් විසඳාගත හැකි අවස්ථා **දෙකක්** දක්වන්න.

(x) ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යුහය තුළ අන්තර්ගත අංශ **දෙකක්** නම් කරන්න.

(ලකුණු $02 \times 10 = 20$ යි)

(1)

- පළාත් සභාව කැඳවීම, වාර අවසාන කිරීම, විසුරුවා හැරීම.
- පළාත් සභාව ඇමතීම හා සංදේශ යැවීම.
- ප්‍රධාන ඇමතිවරයා පත් කිරීම.
- අමාත්‍ය මණ්ඩලය හා අනෙක් පළාත් විධායක නිලධාරීන් පත් කිරීම.
- පළාත් සභා ප්‍රඥප්තීන් අනුමත කිරීම.
- හදිසි අවස්ථාවන්හිදී ජනාධිපතිවරයාගේ උපදෙස් අනුව ක්‍රියාකිරීම.
- මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය කිරීම.
- පළාත් සභාවේ නාමික විධායකයා වශයෙන් පළාත් මහ ඇමතිවරයාගේ උපදෙස් මත ක්‍රියා කිරීම.

**වෙන්කර ලියා ඇති ඒවාද සලකන්න.**

**(ඉහත සඳහන් කරුණුවලින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු දෙන්න.)**

(II)

WWW.OLEVELAPI.COM

- කුමක්, කොපමණ නිෂ්පාදනය කරන්නේද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේද?
- කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේද?

**(මෙම ප්‍රශ්න තුනෙන් ඕනෑම දෙකක් සඳහා ලකුණු දෙන්න.)**

(iii)

- උපරිම යහපත,
- සහභාගිත්වය,
- වෙනස්කොට නොසැලකීම,
- පැවැත්ම හා සංවර්ධනය

**(මෙයින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු දෙන්න)**

(iv) 5S - ඵලදායිතා සංකල්පය භාවිතය

CP - සුපිරිසිදු නිෂ්පාදනය

GP - හරිත ඵලදායිතාව

TQM - පූර්ණ ගුණාත්මක කළමනාකරණය

Poka Yoke - වැරදි ශූන්‍ය කිරීම

PPP - බැහැර කිරීමේ වගකීම නිෂ්පාදකයාට පැවරීම

**(මෙයින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු දෙන්න)**

සිංහල හෝ ඉංග්‍රීසි අකුරු යන දෙකින් එකක් තිබීම ප්‍රමාණවත් වේ.)

(V)

- උඩරට නීතිය
- තේසවලාමේ නීතිය
- මුස්ලිම් නීතිය

(මෙම කරුණුවලින් දෙකක් සඳහා ලකුණු දෙකක් දෙන්න.)

(vi)

- දකුණු ආසියානු වර්ණාත්මක වෙළඳ ගිවිසුම (SAPTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම ( SAFTA)

**(මෙම ගිවිසුම් දෙක සිංහලෙන් හෝ ඉංග්‍රීසි කෙටි නමින් ලියා තිබුණද ලකුණු ලබා දෙන්න.)**

(vii)

- ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ.
- ගැටුම් අවම වේ.
- අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වේ.
- එක් ජාතියක්, එක් රටක් යන හැඟීම වර්ධනය වේ.
- මිනිස් නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ.
- රටේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කිරීමට පෙළඹේ.
- රටේ සංවර්ධනයට දායක වීම ජාතික යුතුකමක් ලෙස සැලකීම.
- අන්‍ය ආගම් හෝ සංස්කෘතින්ට අගරු නොවන සේ හැසිරීමට හුරු වේ.

**(මෙම කරුණු හෝ මීට සමාන වෙනත් පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න)**

(viii)

- බහු පක්ෂ ක්‍රමය
- ද්වි පක්ෂ ක්‍රමය
- ඒක පක්ෂ ක්‍රමය

**(මෙම පිළිතුරු අතුරින් දෙකක් සඳහා ලකුණු දෙකක් ලබා දෙන්න)**

WWW.OLEVELAPI.COM

(xi)

- පවුල් ආරවුල්
- සේව්‍ය සේවක ආරවුල්
- අසල්වාසීන් සමග ඇති වන ආරවුල්
- ආයතන ආයතන අතර ඇති වන ආරවුල්
- සමවයස් කණ්ඩායම් අතර ඇති වන ආරවුල්

**(ඉහත ක්‍රම අතුරින් දෙකක් නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න)**

(x)

- විධායකය
- ව්‍යවස්ථාදායකය
- අධිකරණය

විධායකය වෙනුවට ජනාධිපති ලෙස ද ව්‍යවස්ථාදායකය වෙනුවට පාර්ලිමේන්තුව ලෙස ද ලියා ඇතත් ලකුණු දෙන්න

**(මින් දෙකක් සඳහා ලකුණු දෙන්න.)**

**<u>ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් පල</u>**

- රාජ්‍ය හා ආණ්ඩුව යන සංකල්පය නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.
- රාජ්‍යයේ සහ ආණ්ඩුවේ ප්‍රධාන අංග ලක්ෂණ විග්‍රහ කරයි.
- ජාතික රාජ්‍යයේ ස්වභාවය පැහැදිලි කරයි.
- මධ්‍යම ආණ්ඩුවේ පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල ව්‍යුහය බලතල හා කාර්යභාරය සාකච්ඡා කරයි.

**2.** වර්තමාන ලෝකයේ බොහෝ රාජ්‍ය ජාතික රාජ්‍ය ලෙස සලකනු ලැබෙති.

(i) රාජ්‍ය තුළ දක්නට ලැබෙන ප්‍රධාන ස්වරූප **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) (a) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක පළාත් පාලන ආයතන වර්ග **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එකක** කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

WWW.OLEVELAPI.COM

(i)

- ඒකීය රාජ්‍යයන්
- සන්ධීය රාජ්‍යයන්

**(මෙම කරුණු සඳහා ලකුණු 1 බැගින් දෙන්න)**

(ii)

- එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම
- භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය යන අංශයන්ගෙන් සමන්විත වීම
- වෘත්තීය නිලබල පැලැන්තියක් මඟින් පාලන බලය මෙහෙය වීම
- අභ්‍යන්තර හා බාහිර කටයුතු සම්බන්ධයෙන් ස්වාධිපති බලය හිමිවීම

**(මෙවැනි ආකාරයක පිළිතුරු සපයා ඇත්නම් එක් කරුණක් සඳහා එක් ලකුණක් බැගින් ලබා දෙන්න)**

(iii)

(a)

- මහනගර සභාව
- නගර සභාව
- ප්‍රාදේශීය සභාව

**(මෙම ආයතන තුන නම් කිරීමට ලකුණු 3ක් දෙන්න)**

- ඒවායින් සිදුවන කාර්යයන් කෙටියෙන් දක්වා තිබීම
- උදා:- කසළ බැහැර කිරීම, මහජන සෞඛ්‍යය, සේවා පවත්වා ගෙන යාම, මංමාවත් නඩත්තු කටයුතු වැනි කරුණු ලියා තිබිය හැකිය.
- අදාළ ආයතනය නම් කර කාර්යයන් විස්තර කර තිබේ නම් ලකුණු දෙකක් දෙන්න.

**(කාර්යයන් පමණක් විස්තර කර තිබේ නම් ලකුණු 1ක් දෙන්න.)**

**<u>ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් පල</u>**

- පරිසරය යන්න නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.
- මිනිසා හා පරිසරය අතර පවත්නා අන්තර් සම්බන්ධතා පැහැදිලි කරයි.
- වත්මන් පාරිසරික ගැටලු හඳුනාගෙන ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- පාරිසරික ගැටලු කෙරෙහිවන සමාජ බලපෑම් නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.
- පරිසර දූෂණය නිසා ඇති වන ප්‍රතිඵල නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.
- තිරසර සංවර්ධනයේ වැදගත්කම අගය කරමින් අදහස් දක්වයි.
- තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් පුද්ගල, රජයේ සහ විවිධ සමාජ ආයතනවල යුතුකම් විස්තර කරයි.

**3.** සංවර්ධන ක්‍රියාදාමයන්හි දී පාරිසරික බලපෑම් කෙරෙහි වඩාත් සැලකිලිමත්වීම පුරවැසියන්ගේ වගකීමක් වේ.

(i) තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීමේ දී පරිසර සංවර්ධනයට අදාළව මුහුණදීමට සිදු වන අභියෝග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) ලොව තුළ සිදු වන වනහායනය නිසා ඇති වී තිබෙන අහිතකර ප්‍රතිඵල **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) වනහායනය අවම කිරීම සඳහා පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එකක්** ක්‍රියාත්මක කළ හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 02 යි)

(i )

- පරිසර හිතකාමී සම්පත් පරිහරණය.
- මිහිතලයට දැරිය හැකි සංවර්ධනය.
- සෞන්දර්යාත්මක බව රැක ගැනීම.

**(මෙවැනි පරිසරයට අදාළව අභියෝග ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.)**

(ii)

- වායුගෝලීය ඔක්සිජන් සැපයුමට බාධා වීම
- කාබන්ඩයොක්සයිඩ් අවශෝෂණ හැකියාව හීන වීම
- පානීය ජල හිඟය
- ජල සංචිත සිඳී යාම
- වන සතුන් හා මිනිසුන් අතර ඇතිවන ගැටුම්
- පාංශු තෙතමනය ඉවත් වීම
- ගංවතුර හා නායයෑම් වැඩි වීම
- පස නිසරු වීම
- ජීවීන්ගේ වාසස්ථාන අහිමි වීම
- පරිසර සෞන්දර්ය පිරිහීම
- දැව, ආහාර, ඖෂධ සැපයීම සීමා වීම
- ජෛව විවිධත්වය විනාශ වීම
- පාංශු ඛාදනය වැඩි වීම
- ගෝලීය උණුසුම ඉහළ යාම
- භූගත ජල මට්ටම පහළ යාම
- නියඟය
- කාන්තාරකරණය
- ජල චක්‍රයේ ක්‍රියාකාරිත්වයට බාධා පැමිණ වීම

**(මෙවැනි ඕනෑම කරුණු තුනක් ලියා ඇත්නම් එක් කරුණක් සඳහා එක් ලකුණක් බැගින් දෙන්න.)**

(iii)

(a)

- විවිධ ක්‍රියාකාරකම් මගින් ප්‍රජාව දැනුවත් කිරීම
- වන වගාවන් ඇති කිරීම
- දැව වෙනුවට වෙනත් ආදේශක භාවිතය
- නිවසේ ඵලදායි බෝග වගා කිරීම
- පාසල් වත්තේ ගස් රෝපණය කිරීම
- කැලෑ ගිනි තැබීමෙන් වැළකීම
- වනභායනයට දායක වන්නන් පිළිබඳව අදාළ අංශ දැනුවත් කිරීම
- වන සංරක්ෂණ නීතිරීති පිළිබඳව තමා දැනුවත් වීම හා අන් අය දැනුවත් කිරීම

**(මෙවැනි සුදුසු පිළිතුරු ලියා ඇත්නම් ලකුණු 3ක් දෙන්න.)**

(b) එය ක්‍රියාත්මක කළ හැකි ආකාරය උදාහරණ මගින් පැහැදිලි කර තිබිය යුතුය.

**(විස්තරය සඳහා ලකුණු දෙකක් දෙන්න.)**

WWW.OLEVELAPI.COM

**<u>ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් පල</u>**

- ගැටුම් යනු කුමක්දැයි හඳුන්වයි.
- ගැටුම් වර්ග නම් කරයි.
- ගැටුම් ඇති වීම සඳහා බලපාන හේතු පැහැදිලි කරයි.
- ගැටුම් නිරාකරණය කිරීම සඳහා විවිධ ක්‍රමවේද පැහැදිලි කරයි.
- ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීම පුරවැසියකු සතු යුතුකමක් බව පිළිගනිමින් කරුණු දක්වයි.
- සාමකාමීව ගැටුම් නිරාකරණය කර ගැනීමට පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග සාකච්ඡා කරයි.
- ගැටුම් මඟ හැරීම හා සාමකාමීව විසඳා ගැනීමෙන් තම ජීවිතයට සිදු වන යහපත අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි.

4. ගැටුම නොවැළැක්විය හැකි දෙයක් හෝ නියත වශයෙන් සිදුවන්නක් හෝ නොවේ. ගැටුම වැළැක්විය හැකි දෙයකි.

(i) ගැටුම් ඇති විය හැකි පාර්ශ්ව **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ගැටුම් ඇති වීම කෙරෙහි බලපාන ප්‍රධාන මූල **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ගැටුම් සාමකාමීව විසඳා ගැනීම මගින් ඇති වන වාසි **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එක්** වාසියක් නිසා සමාජයට ඇති වන ප්‍රයෝජන විස්තර කරන්න. (ලකුණු 02 යි)

(i)

- පුද්ගලයා තුළ
- ජන කණ්ඩායම් අතර
- පුද්ගලයන් අතර
- රටවල් අතර

මීට අමතරව ආගමික කණ්ඩායම් අතර, ජනවර්ග අතර වැනි පිළිතුර සලකා බැලිය හැකිය).

**(මින් කරුණු දෙකකට ලකුණු 2ක් දෙන්න.**

(ii)

- වාර්ගිකත්වය
- සමාජ ආර්ථික තත්ත්වය
- දේශපාලනය
- ආගමික මතවාද

**(මින් කරුණු තුනක් සඳහා ලකුණු 3ක් දෙන්න.)**

(iii)

(a)

- ජීවිත හානි වැළකීම
- දේපල හානි වැළකීම
- මානසික ආතතිය අවම වීම
- ආත්ම ගෞරවය සුරැකීම
- දේශපාලන ස්ථාවරත්වය
- සාමය හා ආරක්‍ෂාව සුරක්‍ෂිත වීම
- මූලික හා මානව අයිතීන් ආරක්‍ෂා වීම
- පුද්ගල මානසිකත්වය ඉහළ යෑම
- ආර්ථික ස්ථාවරත්වය
- ජාතික ඒකාබද්ධතාව ඇති වීම
- රට සමෘද්ධිමත් වීම
- පරිසරය ආරක්ෂා වීම

**(මින් කරුණු තුනක් දක්වා ඇත්නම් ලකුණු 3ක් දෙන්න.)**

(b)

ඉන් එක් වාසියකින් සමාජයට ඇති වන ප්‍රයෝජන පිළිබඳව කරුණු දක්වා තිබිය යුතුය

W W W . O L E V E L A P I . C O M

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් පල**

- නිර්වචන ඇසුරින් නීතිය පැහැදිලි කරයි.
- වත්මන් අධිකරණ පද්ධතියට අයත් අධිකරණ වර්ග නම් කරයි.
- වත්මන් අධිකරණ වර්ගවල බලතල හා කාර්යය පැහැදිලි කරයි.
- වත්මන් අධිකරණ වර්ගවල බලතල හා කාර්යයන් පිළිබඳ තොරතුරු දැන ගැනීම සහජීවනයට හේතු වන බව පිළිගනිමින් අදහස් දක්වයි.
- නීතිගරුක පුරවැසියකු ලෙස ජීවත්වීමේ වැදගත්කම අගය කරමින් අදහස් ඉදිරිපත් කරයි.

**5.** සමාජයක යහපැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා සෑම පුරවැසියකුම නීතිය පිළිබඳව දැනුවත්ව සිටිය යුතු ය.

(i) වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අධිකරණ ආයතන **දෙකක්** සඳහන් කරන්න. (ශ්‍රේෂ්ඨාධිකරණය හැර) (ලකුණු 02 යි)

(ii) ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලතල **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (a) අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා ඇති විය හැකි අවාසි **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

**(ලකුණු 2ක් දෙන්න.)**

(i)

- අභියාචනාධිකරණය
- මහාධිකරණය
- පළාත්බද මහාධිකරණය
- දිසා අධිකරණය
- මහේස්ත්‍රාත් අධිකරණය

**(මෙයින් ඕනෑම දෙකකට ලකුණු ලබා දෙන්න.)**

(ii)

- ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම
- මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ පෙත්සම් විභාගය
- ජනමත විචාරණ පෙත්සම් විභාගය
- ජනාධිපතිවරණ පෙත්සම් විභාගය
- පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ අධිකරණ බලය
- උපදේශනාත්මක අධිකරණ බලය
- රීති සැකසීමේ අධිකරණ බලය
- අවසාන අභියාචනාධිකරණ බලය

WWW.OLEVELAPI.COM

**(මින් ඕනෑම තුනක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.)**

(iii)

(a)

- පුද්ගලයන් තුළ අධිකරණ පද්ධතිය හා නීතිය පිළිබඳ විශ්වාසයක් නොමැතිවීම.
- අවනීතිය ඉදිරියට ඒම
- අපරාධ හා දූෂණ වර්ධනය වීම
- නීතියේ සමානත්වය හා සාධාරණත්වය පිරිහීම
- යුක්තිය ඉටු කර ගැනීමට අනියම් ක්‍රම භාවිතය
- යුක්තිය ඉටු කර ගැනීමට කාලය හා වියදම අධික වීම
- මිනිසුන් තුළ අධිකරණයට හා නීතියට ඇති ගෞරවය හීන වීම

**(මෙවැනි කරුණු තුනක් දක්වා ඇත්නම් ලකුණු 3ක් දෙන්න.)**

(b)
ඉන් එක් අවාසියක් විස්තර කිරීම අවශ්‍යයි.

**(ලකුණු දෙකක් දෙන්න.)**

**<u>ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් පල</u>**

- බහු සංස්කෘතිය යන්න පැහැදිලි කරයි.
- බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ විස්තර කරයි.
- බහු සංස්කෘතික ජන සමාජයක් ඇති වීම කෙරෙහි බලපාන සාධක විස්තර කරයි.
- යහපාලනය අර්ථ දක්වයි.
- යහපාලන ගුණාංග සාකච්ජා කරයි.
- එකිනෙකාගේ දේශපාලන, සමාජ ආර්ථික හා සංස්කෘතික අනන්‍යතාවට ගරු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- බහු සංස්කෘතික ජන සමාජයක පැවැත්ම යහපාලනය තුළින් තහවුරු වන ආකාරය පැහැදිලි කරයි.
- බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග පැහැදිලි කරයි.
- බහු සංස්කෘතික සමාජයක සාමාජිකයකු ලෙස එක්සත්ව ජීවත්වීමේ ජාතික වැදගත්කම අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි.

**6.** පුද්ගලයා ජීවත්වන සමාජය අනුව සංස්කෘතියේ විවිධතා දැකිය හැකි ය.

(i) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් ලෙස පිළිගැනීමට හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපා ඇති හේතු **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) (a) යහපාලනය සාර්ථක කර ගැනීමට සමාජයක් තුළ තහවුරු කරගත යුතු සමාජ හා සංස්කෘතික සාධක **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එකක්** ක්‍රියාත්මක කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(i)

- පිහිටීම
- සංක්‍රමණ
- ආක්‍රමණ
- වෙළඳාම සඳහා පැමිණීම
- ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම
- විවිධ ජාති ආගම් භාෂා සහිත පුද්ගලයන් ජීවත්වීම
උදා:- සොලීන්ගේ ආක්‍රමණ ආදී ලෙස)

**(මෙම කරුණු හෝ මීට අදාළ වෙනත් කරුණු ලියා ඇත්නම් ලකුණු දෙකක් දෙන්න.**

(ii)

- අනවශ්‍ය ආකාරයට බලය මධ්‍යගත වීම
- රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමතාව
- රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම
- නිලධාරිවාදය
- අල්ලස දූෂණ ඉහළ යෑම
- රාජ්‍ය පාලකයකින් වගකීමෙන් තොර වීම
- රාජ්‍ය ප්‍රතිපත්ති නිර්ණය කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී ජනතාවාදී නොවීම
- පෞද්ගලික අංශය ජාතික අභිලාෂ නොසලකා හැරීම
- ලාභ ඉපයීම මූලික කොට සැලකීම
- ජාත්‍යන්තර බලපෑම්
- අධිකරණ ආයතන වැනි ස්වාධීන ආයතනවලට පුද්ගලයන් සහ කණ්ඩායම් වශයෙන් සිදු කරන බලපෑම්

**(මෙවැනි කරුණු තුනක් සඳහා ලකුණු 3ක් දෙන්න.)**

W W W . O L E V E L A P I . C O M

(iii)

(a)

- කැමති ආගමක් ඇදහීම
- සිරිත් විරිත් අනුගමනය කිරීම
- විවිධ උත්සව පැවැත්වීම
- කැමති ප්‍රදේශයක පදිංචි වීම
- විවිධ භාෂාවන් ඉගෙනීම හා භාවිතය
- නිදහසේ ගමනාගමනය
- අන්‍ය සංස්කෘතින්ට ගරු කිරීම
- වාර්ගික සහජීවනය

**(මෙවැනි කරුණු තුනක් නම් කිරීමට ලකුණු තුනක් දෙන්න).**

(b)

විස්තරය යටතේ එහි වැදගත්කම, කළ හැකි ආකාරය දක්වා තිබීම ප්‍රමාණවත් වේ.

**(ඉන් එකක් විස්තර කිරීමට ලකුණු දෙකක් දෙන්න.)**

**<u>ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් පල</u>**

- මානව හිමිකම් සංකල්පය නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.
- මූලික අයිතිවාසිකම් විග්‍රහ කරයි.
- මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධ වැදගත්වන ඓතිහාසික ප්‍රයත්න පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන් විසින් සම්මත කර ගත් ප්‍රකාශන පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- එක්සත් ජාතීන් විසින් ළමා අයිතිවාසිකම් සුරැකීමට ගෙන ඇති පියවර විස්තර කරයි.

**7.** මානව හිමිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීම පුරවැසියන් සතු වගකීමක් වේ.

(i) මානව අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා ඇති වූ වැදගත් ඓතිහාසික අවස්ථා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය (ICCPR) මගින් සහතික කර ඇති අයිතිවාසිකම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබට හිමි අයිතිවාසිකම් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

WWW.OLEVELAPI.COM

(i)

- ක්‍රි.ව. 1215 - බ්‍රිතාන්‍ය මැග්නා කාර්ටා ගිවිසුම
- ක්‍රි.ව. 1689 - බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත
- ක්‍රි.ව. 1776 - ඇමරිකානු නිදහස් ප්‍රකාශනය
- ක්‍රි.ව. 1789 - මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය
- ක්‍රි.ව. 1917 - රුසියානු විප්ලවය

(වර්ෂ සඳහන් කිරීම අත්‍යවශ්‍ය නොවේ.)

**(ඉහත කරුණුවලින් දෙකක් සඳහන් කිරීමට ලකුණු දෙකක් දෙන්න.)**

(ii)

- ජීවත් වීමට ඇති අයිතිය
- පෞද්ගලික නිදහසට හා ආරක්ෂාවට ඇති අයිතිය
- කුරිරු අමානුෂික හෝ අවමත් සහගත සැලකිලිවලින් හා වද හිංසාවලින් මිදී සිටීමට ඇති අයිතිය
- නීතිය හමුවේ පුද්ගලයකු ලෙස පෙනී සිටීමට ඇති අයිතිය
- අතීතයට බලපාන අයුරින් පනවන දඬුවම්වලින් මිදී තිබීමට ඇති අයිතිය
- වහල්භාවයෙන් මිදී සිටීමට ඇති අයිතිය
- සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය
- ආගම් ඇදහීමේ නිදහස
- සාමකාමී ලෙස රැස්වීමේ නිදහස
- මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කිරීමට ඇති අයිතිය
- මහජන නියෝජිතයකු ලෙස තෝරාපත් කර ගැනීමට ඇති අයිතිය

**(මෙම වගන්තිවල අදහසට සමාන වගන්ති තුනක් ලියා ඇත්නම් ලකුණු තුනක් දෙන්න.)**

(ii)

(a)

- අධ්‍යාපනය ලැබීමට
- ළමයකු ලෙස ජීවත් වීම
- ප්‍රකාශනයේ නිදහස
- ක්‍රීඩා කිරීමට හා විනෝදයෙන් සිටීමට
- සෞඛ්‍ය හා පෝෂණ පහසුකම් ලබා ගැනීමට
- අන්‍යයන් හා සමානව සැලකීම
- තම ආගම ඇදහීමේ අයිතිය

**(මෙවැනි ගැළපෙන පිළිතුරු තුනක් නම් කර තිබේ නම් ලකුණු තුනක් දෙන්න.)**

(b)

ඉන් එකක් විස්තර කිරීම අවශ්‍යයි.

**(ලකුණු දෙකක් දෙන්න.)**

WWW.OLEVELAPI.COM